# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
# Wayamba University of Sri Lanka

## කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
## STAFF DEVELOPMENT CENTRE

***Higher Diploma in Teaching Methodology & Education Management (HDTMEM)***
***Professional Diploma in Teaching Technology & Methodology (PDTTM)***

**උසස් ඩිප්ලෝමා පාඨමාලාව - ඉගැන්වීමේ ක්‍රමවේදයන් සහ අධ්‍යාපන කළමණාකරණය**
**වෘත්තීය ඩිප්ලෝමා පාඨමාලාව - ඉගැන්වීමේ තාක්ෂණය සහ ක්‍රමවේදයන්**

ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයකින් ගුරු වෘත්තිය පිළිබඳ ඉහල මට්ටමේ සුදුසුකමක් සපුරා ගැනීමට සුවිශේෂී අවස්ථාවක්

### I. ඉගැන්වීමේ ක්‍රමවේදයන් සහ අධ්‍යාපන කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව
### Higher Diploma in Teaching Methodology and Education Management (HDTMEM)

- ගුරු වෘත්තියේ යෙදී සිටින්නන්ට සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැකියා අපේක්ෂාවෙන් සිටින අපේක්ෂකයනට වෘත්තීය සුදුසුකමක් වන පාඨමාලාවකි.
- වෘත්තීය පලපුරුද්ද ඇති අයට උපාධි පාඨමාලාවක් හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකිය හැකි SLQF –IV/ NVQL –VI මට්ටමේ පාඨමාලාවකි.
- ප්‍රවීණ විශ්වවිද්‍යාල ආචාර්ය මඩුල්ලක් විසින් මෙහෙයවනු ලබන ඉගෙනුම් න්‍යාය හා ක්‍රමවේදයන්, අධ්‍යාපන දර්ශනය, අධ්‍යාපන මනෝවිද්‍යාව, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය, ඇගයීම් ක්‍රම සහ තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් ඇතුලත් පාඩම් මාලා 45 ක් හා ක්ෂේත්‍ර අධ්‍යයන, සැසි අධ්‍යයන හා සාකච්ඡා ඇතුලත් සති 30 ක සති අන්ත පාඨමාලාවකි (ඉරිදා දිනවල).
- ඉගෙනුම් කාර්ය සාධන වාර්තාව, ඉගෙනුම් ඉදිරිපත් කිරීම් සහ පැවරුම් පාදක ඇගයීම් ක්‍රමය.

**සුදුසුකම්:**
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය මගින් පවත්වන ඉගැන්වීමේ තාක්ෂණය සහ ක්‍රමවේදයන් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (PDTTM) හදාරා තිබීම හෝ SLQF – III/ NVQL – V මට්ටමේ හෝ ඊට ඉහල අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ගුරු/ පුහුණුකරු/ උපදේශක/ ප්‍රදර්ශක/ අධ්‍යයන සහායක/ පෙරපාසල් ගුරු සහායක ලෙස හෝ අධ්‍යාපනයට අදාල ක්ෂේත්‍රයක වසර 2 ට නොඅඩු පලපුරුද්ද හෝ විශ්වවිද්‍යාල සනාථන සභාව මගින් පිළිගත හැකි වෙනත් සමාන සුදුසුකමක්.

**පාඨමාලා ගාස්තු:** රු 60,000 (සියලු ගාස්තු ඇතුලත්ව) පාඨමාලා ගාස්තු පළමු තෙමස තුල වාරික 3 කින් ගෙවිය හැක.

### II. ඉගැන්වීමේ තාක්ෂණය සහ ක්‍රමවේදයන් පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමාව
### Professional Diploma in Teaching Technology and Methodology (PDTTM)

- දැනට ගුරු වෘත්තියේ නියැලෙන හා නියැලීමට අපේක්ෂිත අය සඳහා වූ SLQF –III/ NVQL –V මට්ටමේ වෘත්තීය පාඨමාලාවකි.
- කාර්මික විද්‍යාල, විද්‍යාත මධ්‍යස්ථාන සහ වෙනත් අධ්‍යාපන ආයතන වල කථිකාචාර්යවරුන් සහ උපදේශකවරුන් සඳහා වූ කඩඉම් සුදුසුකමක් ලෙස පිළිගත් පාඨමාලාවකි.
- ප්‍රවීණ විශ්වවිද්‍යාල ආචාර්ය මඩුල්ලක් විසින් මෙහෙයවනු ලබන නවීන ඉගැන්වීමේ ක්‍රමවේද හා තාක්‍ෂණය, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රම සහිත සිද්ධාන්තික හා ප්‍රායෝගික න්‍යායන් ඇතුලත් පාඩම් මාලා 24 කින් යුතු සති 30 ක සතිඅන්ත පාඨමාලාවකි.
- ඉගෙනුම් කාර්ය සාධන වාර්තාවක් සහ වාචික ඉදිරිපත් කිරීම්, අඛණ්ඩ අගැයීම් පාදක කර ගත් අවසාන අගැයීම් ක්‍රමය.

**සුදුසුකම්**
අ.පො.ස (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් 2 කින් සමත්ව තිබීම (විෂයයන් 4 ක් සඳහා පෙනී සිටි සිසුන් ඉන් තුනකින් සමත්ව තිබීම) හෝ අ.පො.ස (සා.පෙළ) සමත් වීම සමග පොදු/ අර්ධ රාජ්‍ය/ රාජ්‍ය නොවන/ පුද්ගලික ආයතනයක වසර 02 ක වෘත්තීය පලපුරුද්ද හෝ විශ්ව විද්‍යාලීය සනාථන සභාව මගින් පිළිගත හැකි වෙනත් සමාන සුදුසුකමක්.

**පාඨමාලා ගාස්තු:** රු. 45,000 (සියලු ගාස්තු ඇතුලත්ව) පාඨමාලා ගාස්තු පළමු තෙමස තුල වාරික 3 කින් ගෙවිය හැක.

**බඳවා ගැනීමේ අයදුම් පත්:** http://sdc.wyb.ac.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ sdc@wyb.ac.lk යන විද්‍යුත් තැපෑල හරහා අයදුම්පත් ලබාගත හැක. නැතහොත් පහත දැක්වෙන ලිපිනයට තම නම සහ ලිපිනය ලියන ලද මුද්දර ඇලවූ ලියුම් කවරයක් එවීමෙන් ගෙන්වා ගත හැක. සම්පූර්ණ කරන ලද අයදුම්පත් සුදුසුකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සහතිකවල පිටපත් සමග පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් ගෙනැවිත් භාර දිය යුතුය. **අයදුම් පත් එවිය යුතු ලිපිනය: අධ්‍යක්ෂ, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල, 60170.**

**විමසීම්:** අධ්‍යක්ෂ, කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, දුරකථන: (071/077) 362 8911, 071 847 3017, 071 373 0495, 076 535 9523, 031 331 5377, විද්‍යුත් තැපෑල: sdc@wyb.ac.lk

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය: 2018 අගෝස්තු 31**